www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ටෙරී ෂියාවෝ නඩු තීන්දුවට බුෂ් හා කොන්ග්‍රසය හොට දමයි: ප්‍රතිගාමීත්වයට සේවය කිරීමේ දේශපාලන මැරකම්

## Bush, Congress intervene in Terry Schiavo case: political thuggery in the service of reaction

**කර්තෘ මණ්ඩලය විසිනි**
**2005 මාර්තු 21**

පසුගිය වසර 15 තුල දිවි සුරැකීමේ වෛද්‍ය උපකරනවල ආධාරයෙන් ජීවත්වන ෆ්ලොරිඩාවෙහි වෙසෙන ටෙරී ෂියාවෝ නමැති කාන්තාවගේ නඩු තීන්දුවට කොන්ග්‍රසය හා බුෂ් පාලන තන්ත්‍රය හොට දැමීම ඒකාන්තයෙන් ම දේශපාලන මැර ක්‍රියාවක් වන අතර මෙය අතිශය ප්‍රතිගාමී දේශපාලන අරමුනු සඳහා පවුලක ඛේදවාචකයක් ගසාකෑමකි. සදාචාරාත්මක වසයෙන් එය ද්වේශ සහගත ක්‍රියාවක් මෙන් ම මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් වෙත කෙලින්ම එල්ල කරන ලද ප්‍රහාරයක් ද වේ.

ඉතාමත් ලෙන්ගතු සහ පෞද්ගලික උත්සුකයන් සම්බන්ධයෙන් අසංරෝධිත ආන්ඩුබලය යෙදීම එක්සත් ජනපද පාලනාධිකාරය හා එහි දේශපාලන ඒජන්තයන්ගේ දේශපාලන දිශානතිය පිලිබඳ අනිටු පෙරනිමිති සහිත අනතුරු ඇඟවීමකි. කොන්ග්‍රසය තුල බලපෑම් යොදා අනුමත කරවා ගනු ලැබූ හදිසි පනත හා සමගාමීව ආගමික උන්මාදය කෙරේ විවෘත ආයාචනා කිරීමත් මයිකල් ෂියාවෝට හා ඔහුගේ නීතිඥයාටත් වෛද්‍ය උපකරනවල ආධාරය ඉවත් කල යුතු බවට ෂියාවෝ විසින් ගන්නා ලද තීරනය අනුමත කල ෆ්ලොරිඩාහි විනිශ්චයකරුටත් එරෙහිව ප්‍රචන්ඩත්වය දියත් කිරීමට සූක්ෂම ලෙස සැඟවූ පෙලඹවීම් ක්‍රියාත්මක විය.

ෂියාවෝ සුවකල නොහැකි අන්දමේ මොලයෙහි අප්‍රානික තත්වයකින් පසුවන බව වෛද්‍යවරුන් ප්‍රකාශ කර තිබිය දී ඇගේ ඉරනම පිලිබඳව පවුලේ අභ්‍යන්තර මතභේදයන් නරුම හා තිරස්චීන ලෙස ගසාකෑම වූ කලි බුෂ් හා කොන්ග්‍රසයෙහි ඔහුගේ රිපබ්ලිකානු සහායකයින් විසින් දියත් කරන ලද මෑතම දේශපාලනමය ප්‍රකෝපකරනය යි. ඉතාමත් පසුගාමී අමනෝඥ හා නොරිස්සුම් සහගත සමාජ කොටස් උසිගැන්වීම සඳහා ගබ්සා කිරීමේ අයිතීන් සමලිංගික විවාහ, පාසල් තුල යාඥා පැවැත්වීම ආදි ''දහනශීලී'' ප්‍රශ්න මතට පැනගැනීමේ හොඳින් ස්ථාපිතවූ රටාවක් එය අනුගමනය කරයි.

එක්සත් ජනපද රාජ්‍ය බලයෙහි සියලු ලීවරයන් පාලනය කරන්නා වූ අන්ත ප්‍රතිගාමීන් ඇමරිකානු ජනතාවගෙන් අති බහුතරයක් විසින් විරෝධය දක්වන මිලිටරිවාදය හා යුද්ධයඃ සමාජ ආරක්ෂනය, වෛද්‍ය උපස්ථානය හා වෛද්‍ය ආධාර, වනසාලීම ද ප්‍රජාතන්ත්‍රීය අයිතීන් විනාශ කිරීමේ ද දක්ෂිනාංශික ප්‍රතිපත්තීන්හි සමාජ පදනමක් නිර්මානය කරන්නේ මේ ආකාරයට ය. ව්‍යාපාරික ලාභ රැස් කිරීමේ සියලු නීතිමය හා දේශපාලනමය සීමාවන් ඉවත් කිරීමත්, පෞද්ගලික ධනය එක් රැස් කිරීම අශික්ෂිත මට්ටම් කරා ගෙන යෑමත්, අරමුනු කර ගත් එක්සත් ජනපද පාලක ප්‍රභූවේ වඩාත්ම කොල්ලකාරී හා සාපරාධී කොටස් මෙවැනි තත්වයන් මාධ්‍ය කර ගනිමින් බුෂ් හා ඔහුගේ සමාගම පිටුපසින් පෙලගැසී සිටිති.

ෂියාවෝ සිද්ධියෙන් පැහැදිලි වන පරිදි ඇමරිකානු ජනතාවන්ගේ මූලික අයිතීන්ට එරෙහිව එල්ල කරන ලද මේ ප්‍රහාරයෙහි දී ඩිමොක්‍රටික් පක්ෂය කැමැත්තෙන්ම එහි හවුල්කරු වශයෙන් කටයුතු කර ඇත.

ෂියාවෝ නඩු තීන්දුව ''ජීවිතයට ඇති අයිතිය'' පිලිබඳ නිදසුනක් ලෙස ගත් ක්‍රිස්තියානි මූලධර්මවාදී කන්ඩායම්වල පෙලඹවීම් මත ක්‍රියා කරමින්, පසුගිය සතියේ කොන්ග්‍රසය තුල සිටින රිපබ්ලිකානුවන්, වෛද්‍ය උපකරනවල ආධාරයෙන් ජීවත් කිරීම අත්හිටුවීමට ඉඩදුන් ෆ්ලොරිඩාහි විනිශ්චයකරුගේ තීරනය ආපසු හැරවීමේ උත්සාහයන් මාලාවක නිරත වූහ.

''තෙරේසා මාරි ෂියාවෝගේ දෙමාපියන්ට ආධාර වසයෙන්'' යන හිසින් යුතු නීති කෙටුම්පතක් සලකා බැලීම සඳහා පසුගිය ඉරිදා නියෝජිත මන්ත්‍රීමන්ඩලය හා සෙනෙට් සභාව හදිසි සැසිවාරයක් පැවැත්වී ය. ජීවිත ආධාරකයන් ඉවත් කරගැනීම අවහිර කිරීම සඳහා ෆෙඩරල් උසාවියෙහි නඩු පැවරීමට මින් දෙමාපියන්ට ඉඩ සැලසෙනු ඇත. ක්‍රිස්තියානි දක්ෂිනාංශයේ පහත් ආශාවන් සංසිඳුවීම තකතිරු ලෙස ප්‍රදර්ශනය කරමින් නීති කෙටුම්පත් අත්සන් තැබීමට හැකිවන පරිදි ටෙක්සාස් ප්‍රාන්තයේ ක්‍රෝෆර්ඩ්හි ගොවිපලෙහි සති අන්තය ගත කරමින් සිටි ජනාධිපති බුෂ් ගුවන් මගින් ආපසු පැමිනියේ ය.

මෙම කාරනයේ දී බුෂ් හා කොන්ග්‍රසයෙහි සියලු කටයුතු පුරා පැතිරගිය නිර්ලජ්ජිත කුහකත්වය ආදර්ශමත් කරමින්, ෂියාවෝ සිද්ධිය වැනි ජීවිතයත් මරනයත් පිලිබඳ ප්‍රශ්නවල දී විනිවිදභාවයකින් ද, ප්‍රවේශමෙන් ද සලකා බැලිය යුතු බව ජනාධිපති විශ්වාස කරන්නේ යයි ධවල මන්දිර ප්‍රකාශක ස්කොට් මැක්ලෙලන් ප්‍රකාශයක් නිකුත් කරමින් කියා සිටියේ ය. මෙසේ පවසන්නේ ටෙක්සාස්හි ආන්ඩුකාරයා වසයෙන් මරන දන්ඩනයට නියම වූ සිරකරුවන් 152කුගේ අභියාචනා සලකා බැලීමේ දී එකකට දල වසයෙන් විනාඩි 15ක් බැගින් පමනක් ගත කරමින් ඔවුන්ට මරන දන්ඩනය පැනවීමට රබර් මුද්‍රාව තැබූ පුද්ගලයා සම්බන්ධයෙනි. ඉරාකයෙහි මුලුමහත් නගර බිමට සමතලා කිරීම, එක්සත් ජනපද විශේෂ බලකායන් හා සීඅයිඒ ඝාතක කන්ඩායම් ලොව වටා පිටත්කර යැවීම හා පුලුල් ලෙස වධ බන්ධන පැමිනවීම ද බුෂ්ගේ ධවල මන්දිරයෙහි ''මිනිස් ජීවිතවලට ගරු කිරීමේ'' වාර්තාවට ඇතුලත් වේ.

බුෂ් හා රිපබ්ලිකානුවන් විසින් වගා දිගා කරනු ලැබූ (ඇමරිකානු ජනතාවගෙන් කුඩා සුලුතරයකගේ අනුගාමිකත්වයක් සහිත වෘත්තීයමය ක්‍රිස්තියානි මූලධර්මවාදී උන්මත්තකයන්, ෂියාවෝ සිද්ධියේ දී ධවල මන්දිරයේ හා කොන්ග්‍රසයේ උප්පරවැට්ටිවලට හුරේ දමද්දී පසුගිය දින ගනනාවේ සිදුවීම් දෙස ජනගහනයෙන් මහත් බහුතරයක් බලා සිටියේ අදහා ගත නො හැකි හා පිලිකුලෙන් යුතුව ය. (පවුල් ජීවිතයෙහි ඉතාමත් ලෙන්ගතු ක්ෂේත්‍රයක් වෙත ෆෙඩරල් ආන්ඩුවක් විසින් දේශපාලන අභිප්‍රේරනයක් සහිතව කල එවන් මැදිහත් වීමකට පලවන මහජන සහයෝගය ඉතාමත් අල්ප බව මත විමසීම්වලින් පෙනී යයි). අමානුෂිකත්වයේ ද නරුමත්වයේ ද මෙම සන්දර්ශනය විසින් අවශේෂ ලෝකය දැඩි ලෙස නොමග යවනු ලැබිනි.

ෂියාවෝ සිද්ධිය ඇමරිකානු ධනේශ්වර දේශපාලනයෙහි පවත්නා ප්‍රවනතාවන් ගනනාවක් විදහා පායිඃ රිපබ්ලිකන් පක්ෂය තුල ක්‍රිස්තියානි මූලධර්මවාදී දක්ෂිනාංශයෙහි තීරනාත්මක බලපෑම ප්‍රතිගාමීත්වය ඉදිරියේ ඩිමොක්‍රටික් පක්ෂයේ බියගුලුකම හා වැඳ වැටීම හා ඇමරිකානු ජනතාවගෙන් අති බහුතරය මුලු ක්‍රියාවලියෙන් ම ඉවත් කර තැබීම.

චිත්තවේගී කම්පනය, නියමිත මාත්‍රාවට වඩා බෙහෙත් පාවිච්චිය හෝ වෙනත් සංකීර්න වෛද්‍ය තත්වයන් හේතු කොට ගෙන එක දිගට මොලේ අකර්මන්‍ය තත්වයකට පත් වී ඇති එක්සත් ජනපදයෙහි වෙසෙන 35,000ක් මිනිසුන්ගෙන් ටෙරී ෂියාවෝ එක් අයෙකි. පෙනීයන පරිදි පොටෑසියම් අසමතුලනයක් හේතු කොටගෙන 1990 වසරේදී ඇදවැටුනු ෂියාවෝ එතැන් සිට පසුව ඇත්තේ ප්‍රතිකර්මවලට ප්‍රතික්‍රියා නො කරන තත්වයක ය. ස්වෝත්සාහයෙන් හුස්ම ගැනීම හැරුනු කොට ආහාර හා ජලය ගැනීමේ දී ඇය යැපෙන්නේ අන්තර් ශිරා පෝෂනය මත ය. ඇගේ මොලයෙහි ක්‍රියාකාරිත්වය නියමාකාරයෙන් ශූන්‍යයට වැටී ඇති අතරේ ඇය පරීක්ෂා කර ඇති අනේකවිධ ස්නායුවේදී විශේෂඥයින් ද අනෙකුත් වෛද්‍යවරුන් ද මේ බව සහතික කොට ඇත. සිහි මූර්ඡා තත්වයකත් පසුව වසර ගනනාවකට ඇතැම්විට දශක ගනනාවකට පසුව පවා අවදිවීමේ අවස්ථාවන් වාර්තාගත වී ඇති නමුදු, මෙවැනි තත්වයකින් සුවය ලැබීමේ සිද්ධියක් පිලිබඳ මෙතෙක් ලේඛන ගත වී නැත.

ෂියාවෝගේ සිද්ධිය පිලිබඳව කිහිප වතාවක් නඩු මගට බැසීමට සිදුව ඇත්තේ ඇයගේ සැමියා වූ මයිකල් හා දෙමව්පියන් වන රොබට් හා මේරි ෂින්ඩ්ලර් අතර ගැටුමක් හේතු කොට ගෙන ය. මොලයේ අක්‍රීය තත්වයකින් තමා ජීවතුන් අතර තබා නොගැනීමට තම බිරිය කැමැත්ත පල කල බව මයිකල් ෂියාවෝ නොකඩවාම ප්‍රකාශ කර ඇත. විවිධ නඩු විභාගවල දී ඔහු දී ඇති සාක්ෂ්‍ය පිලිගත හැකි ඒවා බවට නිගමනය වී ඇත. එමෙන්ම ජීවත්ව සිටිනා කාලත්‍රයා වසයෙන් ජීවිතාධාරක උපකරනවලින් ඇගේ ජීවිතය රඳවා ගැනීම පිලිබඳ තීරනයක් ගැනීමට ඔහුට ඇති අයිතිය අධිකරනයේ දී තහවුරු කොට ඇත.

ෂින්ඩ්ලර්වරුන් සංස්ථිතික කතෝලිකයින් වන අතර පල්ලියේ ධර්මතාවන් ගතානුගතික අර්ථදැක්වීමට එල්බගෙන සිටිති. ස්වයංමෝහනය නිසා හෝ ඔවුන්ගේ ඇති දක්ෂිනාංශික ''පෙරකදෝරුවන්ගේ'' බලපෑම මත හෝ ටෙරී ෂියාවෝගේ තත්වය පිලිබඳව ෂින්ඩ්ලර්වරු සාහසික ලෙස ව්‍යාජ ප්‍රකාශ කර ඇත. - ඇය ඔවුන්ට ප්‍රතිචාර දක්වන බවට ද ඔවුන් සමග සන්නිවේදනයෙහි පවා යෙදෙන බවට ද ප්‍රකාශ කර ඇත්තේ කිසිදු ස්නායුවේදී දත්තයක් හෝ නොමැති තත්වයක් තුල ය.

සාමාන්‍ය තත්වයන් යටතේ මෙම පවුලේ බේදවාචකය අවසන් වන්නට තිබුනේ ප්‍රාදේශීය උසාවියක ය. එහෙත් ව්‍යවස්ථාමය ක්‍රියා පටිපාටියේ රැඩිකල් වෙනසක් කිරීමේ නිමිත්තක් වීම කෙසේ වෙතත් එය ප්‍රධාන ජාතික ප්‍රශ්නයක් බවට පත් වීමට පවා කිසිදු ඉඩක් නො තිබුනි. ඒ සඳහා අවශ්‍ය වූයේ රිපබ්ලිකන් පක්ෂයෙහි ප්‍රධානතම සමාජ පදනමක් වන ක්‍රිස්තියානි දක්ෂිනාංශික කන්ඩායම්වල දේශපාලන මැදිහත්වීම ය.

සිය බිරිඳගේ ජීවිතාධාරක උපකරන ඉවත් කිරීමට ඉඩ දෙන උසාවි නියෝගයක් 2003 වසරේදී මයිකල් ෂියාවෝ ප්‍රථම වතාවට ලබා ගත් පසු ජෝර්ජ් ඩබ්ලිව් බුෂ්ගේ සොහොයුරා වන ෆ්ලොරිඩාහි රිපබ්ලිකන් ආන්ඩුකාර ජෙබ් බුෂ් හා ප්‍රාන්තයේ රිපබ්ලිකන් ව්‍යවස්ථාදායක මන්ඩලය ''ටෙරීගේ නීතිය'' අනුමත කරවා ගැනීමටත් එයට මුද්‍රාව තබා ගැනීමටත් මැදිහත් විය. මේ පනත මගින් ඈ සම්බන්ධයෙන් පමනක්

ජීවිතාධාරක ඉවත් කිරීම තහනම් කෙරින.

අවසානයේදී ෆ්ලොරිඩාහි ශ්‍රේෂ්ඨාධිකරනය විසින් මේ නීතිය අහෝසි කෙරුනු අතර නඩුව ඇසීමේ කාර්ය පෙරලා පිනෙලාස් කවුන්ටි අධිකරනය වෙත පැවරිනි. ටෙරී ෂියාවෝ දිවි ගෙවන්නේ එහි ගිලන් නිවසක ය. පසුගිය සතියේ මේ දිග්ගැස්සුන නෛතික සටන කූටප්‍රාප්ත වූයේ සංචාරක උසාවි විනිශ්චයකරු ජෝර්ජ් ග්‍රියර් ජීවිතාධාරක උපකරන ඉවත් කිරීමට බලය පැවරෙන නියෝගයක් මයිකල් ෂියාවෝ වෙත නිකුත් කිරීමෙන් හා මේ පිලිබඳ වැඩිදුර පරීක්ෂන ඔහුගේ උසාවිය තුල අත්හිටුවීමෙනි.

ජීවිතාධාරක ඉවත් කිරීම නැවත වරක් තහනම් කිරීම සඳහා ෂින්ඩ්ලර්වරුන්ගේ ද සහාය ඇතිව දක්ෂිනාංශික ක්‍රිස්තියානි කන්ඩායම් ෆ්ලොරිඩාහි නියෝජිත මන්ත්‍රී මන්ඩලය හරහා නීති කෙටුම්පතක් අනුමත කරවා ගත් නමුදු, ෆ්ලොරිඩාහි සෙනෙට් සභාව එම නීතිය පරාජය කලේ ය. විනිශ්චයකාර ග්‍රියර් වෙතින් මෙම නඩුව ෆෙඩරල් උසාවිය වෙත මාරු කිරීම සඳහා ෂින්ඩ්ලර්වරුන්ට ඉඩසැදීම ටම්පාහි ෆෙඩරල් විනිශ්චයකරුවෙක් ප්‍රතික්ෂේප කලේ ය.

ඊලඟ පියවර වූයේ කොන්ග්‍රසය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීම ය. ජීවිතාධාරක උපකරන ආධාරයෙන් ජීවත්වන සියල්ලන්ම සම්බන්ධයෙන්, එම උපකරන ඉවත් කිරීමට විරුද්ධවන පවුලේ අයෙකු වේ නම්, ඒ පිලිබඳ තීන්දු කිරීමේ අධිකරන බලය ෆෙඩරල් උසාවි වෙත පැවරීම සඳහා යෝජනාවක් පසුගිය බදාදා නියෝජිත මන්ත්‍රී මන්ඩලය සම්මත කලේ ය. මෙය වූකලි එවන් දහස් ගනනකට අධිකරනය වෙත යන ලෙස ට විවෘත කරන ලද ආරාධනයක් විය. එසේ වුව ද බොහෝ දේ කැටිකොට ගත් නියෝජිත මන්ත්‍රී මන්ඩල කෙටුම්පතට ඇතැම් ඩිමොක්‍රටික්වරුන් දැක්වූ විරෝධතාවන් නිසා ෂියාවෝ නඩුව පමනක් සීමාවන පරිදි වඩාත් පටු කර ගොතන ලද නීති කෙටුම්පතක් සෙනෙට් සභාවේ සැලකිල්ලට භාජන විය. ඉන් පසු මන්ත්‍රී මන්ඩල දෙකෙහිම දෙසතියක පාස්කු නිවාඩුව ඇරැඹිනි. පෙනී යන අන්දමට එමගින් නීති කෙටුම්පතෙහි අවසානය නිශ්චය විය.

පසුගිය සිකුරාදා වේගවත් අනුක්‍රමික සිද්ධීන් මාලාවක් ඇරැඹුනි. ක්‍රිස්තියානි මූලධර්මවාදී කන්ඩායම් අක්‍රියභාවය සම්බන්ධයෙන් නියෝජිත මන්ත්‍රීමන්ඩලය හා සෙනෙට් සභාව හෙලා දුටු අතර රිපබ්ලිකන් පක්ෂයෙහි නායකත්වයට ප්‍රතිප්‍රහාර දෙන බවට තර්ජනය කලහ. ඉනික්බිතිව මයිකල් ෂියාවෝගේ පමනක් නොව, ප්‍රානය නිරුද්ධවූ මොලයක් සහිත ඔහුගේ බිරිඳගේ ද සාක්ෂි කැඳවන සිතාසි නියෝජිත මන්ත්‍රීමන්ඩල හා සෙනෙට් සභා කමිටු විසින් නිකුත් කලේ ය. ටෙරී ෂියාවෝගේ ජීවිත ආධාරකය ඉවත් කිරීමට ගන්නා කිසියම් පියවරක් ෆෙඩරල් සාක්ෂිකරුවෙකුට බාධාකිරීමක් ලෙස අර්ථ දැක්වෙන දරුනු අපරාධයක් සේ සලකන බවට ඒ සමගම තර්ජන නිකුත් කෙරිනි.

මෙම නඩුව සම්බන්ධයෙන් කොන්ග්‍රසයට අධිකරන බලයක් නොමැති බව පවසමින් විනිසුරු ග්‍රියර් සිතාසි ප්‍රතික්ෂේප කලේ ය. ''අධිකරන ක්‍රියාවලියක් සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායක මන්ඩලවලට පෙර ඒජන්සිවලට කල යුත්තක් නැතැයි මම අදහස් කරමි.'' ආන්ඩු ප්‍රතිසංස්කරන සම්බන්ධ නියෝජිත මන්ත්‍රී මන්ඩලය නියෝජනය කරන නීතිඥයෙකුට ඔහු පැවසී ය. ''කාරනය වන්නේ ඔබ -ඔබ කමිටුව - අද දින යම් ක්‍රියාමාර්ගයක් යන්නට තීරනය කිරීමෙන් හදිසි අවස්ථාවක් නිර්මානය වන්නේ නැතැ''යි ඔහු කියා සිටියේ ය. ටෙරී ෂියාවෝට යොදා තිබූ පෝෂන නලය සිකුරාදා විසන්ධි කෙරින.

පෝෂන නලය නැවත සවි කරන මෙන් ඉල්ලා සිටින නියෝජිත මන්ත්‍රී මන්ඩල කමිටුවේ හදිසි ආයාචනයක් එවිට එක්සත් ජනපද ශ්‍රේෂ්ඨාධිකරනය වෙත ඉදිරිපත් විය. අත්සන වහා යොදන ලද මත ප්‍රකාශයක් මගින් ඉහල උසාවියේ සිකුරාදා රාත්‍රියෙහි එම ආයාචනය ප්‍රතික්ෂේප කලේ ය.

තවද, කොන්ග්‍රසයෙහි කමිටු සති අන්තය තුල නීති සම්පාදන කටයුතු ඉදිරියට ගෙනයන බවට සිකුරාදා රාත්‍රියෙහි රිපබ්ලිකානුවන් වන සෙනෙට් සභාවේ බහුතරයෙහි නායක, බිල් ෆ්‍රිස්ට්, හා නියෝජිත මන්ත්‍රීමන්ඩලයෙහි කථානායක, හැස්ටර්ට් නිවේදනය කලහ. ''ෂියාවෝ මහත්මියගේ ජීවිතය බේරාදීමට අවස්ථාවක් සලසන නීති සම්පාදනය සම්බන්ධයෙන් සම්මුතියකට පැමිනීමට තමන් කැපවී සිටින'' බව ඔවුහු ප්‍රකාශ කලහ.

ෂින්ඩ්ලර්වරුන්ට ටැම්පාහි ෆෙඩරල් උසාවිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඉඩ සලසන නීති කෙටුම්පත අනුමත කර ගැනීම සඳහා කොන්ග්‍රසයෙහි විවේක කාලය තුල හදිසි සැසිවාරයක් සඳහා ඉරිදා ෆ්‍රිස්ට් හා හැස්ටර්ට්, කොන්ග්‍රසය යලි කැඳවිය. නීති කෙටුම්පත අනුමත කර ගැනීම සඳහා ඒකමතික එකඟත්වය අවශ්‍ය විය. මෙයට සෙනෙට් සභාවේ ඩිමොක්‍රැටිකයන්ගේ එකඟත්වය ලැබුනු අතර නියෝජිත මන්ත්‍රීමන්ඩලයෙහි ෆ්ලොරීඩාහි ඩිමොක්‍රැටිකයන් ගනනාවක් එයට අවහිර කලහ. සැලසුම වූයේ නියෝජිත මන්ත්‍රී මන්ඩලයෙහි රීති යටතේ හැකි මුල්ම අවස්ථාවෙහි එනම්, සඳුදා පෙ.ව. 12.01ට - එම මන්ඩලයෙහි විධිමත් සැසිවාරයක් කැඳවන නීති කෙටුම්පත බහුතර චන්දයකින් අනුමත කරවා ගැනීමට ය. සඳුදා උදෑසන එයට බුෂ් අත්සන යෙදීමට නියමිත අතර එදිනම ෂින්ඩ්ලර්වරුන් ෆෙඩරල් උසාවියක නඩුවක් පැවරීමට අපේක්ෂිත ය.

මේ පාර්ලිමේන්තු උපාමාරු දැමීම් ප්‍රමානයෙන් අත්‍යසාමාන්‍ය පුරසාරම් සහිත හිරිහැර කිරීම් ද

කුහකත්වය ද කොන්ග්‍රසයෙහි රිපබ්ලිකානුවන් සමග එකට බැඳී ඇත.

ෆෙඩරල් අධිකරනයක කුටෝපායන්ට එරෙහිව ''ප්‍රාන්ත රාජ්‍ය සතු අයිතිය'' ආරක්ෂා කරන්නවුන් ලෙස සාමාන්‍යයෙන් පෙනී සිටින නමුදු මෙහිදී ප්‍රාන්ත උසාවි වල සවිස්තරාත්මක නඩු හබයක් පිලිබඳව ෆෙඩරල් අධිකරන මැදිහත් වීමක් වෙනුවෙන් ඔවුන් තල්ලු වී සිටිති. ''පවුලේ සාරධර්ම'' ප්‍රමුඛ විය යුතු බව ඔවුන් දේශනා කරන අතර සිය බිරියගේ කැමැත්ත පිලිබඳ තමාගේ අවබෝධය මත පදනම්ව තීරනයක් ගැනීමට මයිකල් ෂියාවෝ සතු අයිතිය ඔවුහු පාගා දමති. කම්කරු ජනතාව හා දුප්පතුන් සඳහා ඉදිරිපත් කෙරෙන ක්‍රියාමාර්ගවලට පහර දෙනු වස් ''සීමිත ආන්ඩු'' මැදිහත් වීමක් වෙනුවෙන් පෙනීසිටින පුරෝගාමීන් බව ඔවුන් කියා පාන නමුදු පුද්ගලයින්ගේ අතිශයින්ම පෞද්ගලික වූ කටයුතු සම්බන්ධයෙන් ආන්ඩුවෙහි ආඥාවක් පනවනු වස් ඔවුහු පෞද්ගලිකත්වයේ අයිතින් පිලිබඳ සියලු පූර්වාදර්ශ ඉරා දමති.

ෂින්ඩ්ලර්වරුන්ගේ පදනම් විරහිත ප්‍රකාශවලට විශ්වසනීයත්වයක් ලබාදීම සඳහා සෙනෙට් සභික ෆ්‍රිස්ට්, වෛද්‍යවරයෙකු වසයෙන් තමන් සතු පසුබිම යොදා ගත්තේ ය. ඇස් දල්වාගෙන හා මුව විවර කරගෙන බලා සිටින ටෙරී ෂියාවෝගේ පුලුල් ලෙස ප්‍රචාරය කරන ලද විඩියෝ දර්ශනය සමාලෝචනය කිරීමෙන් අනතුරුව, ''දිගින් දිගටම පවතින මොලේ ක්‍රියාකාරිත්වය ඇනහිට තිබීම'' පිලිබඳ රෝග විනිශ්චය වැරදිය යන්න තමන නිගමනය කල බව ඔහු කියා සිටියේ ය.

ෆ්‍රිස්ට් වූ කලි හෘද රෝග පිලිබඳ ශල්‍ය වෛද්‍යවරයෙකු මිස ස්නායුවේදය පිලිබඳ වෛද්‍යවරයෙකු නොවේ. එමෙන්ම, ප්‍රසිද්ධියට පත් කිසිදු වෛද්‍යවරයෙක් වරනාත්මක ලෙස සංස්කරනය කල වීඩියෝ පටයක් මත පදනම්ව රෝග විනිශ්චයක් නොකරනු ඇත. මෙහිදී තීරනාත්මක වී ඇත්තේ වෛද්‍ය සාධකවලට වඩා දේශපාලන සාධක යි. 2008 වසරේ ජනාධිපති නාමයෝජනා ලබාගැනීමේ ගවේෂයනයක යෙදී සිටින ෆ්‍රිස්ට්හට ඒ සඳහා ක්‍රිස්තියානි දක්ෂිනාංශයේ සහාය තීරනාත්මක වේ.

මරනීය දන්ඩනයේ ද ඉරාකයේ එක්සත් ජනපද යුද්ධයේ ද උද්යෝගිමත් ආධාරකරුවකු වන නියෝජිත මන්ත්‍රීමන්ඩලයේ බහුතරයේ නායක ටොම් ඩිලේ , මොලය මියගිය මෙම කාන්තාව වෙතින් පෝෂන නාලය ඉවත් කිරීම, ''වෛද්‍ය ත්‍රස්තවාදයේ ක්‍රියාවක්'' ලෙස හෙලා දුටුවේ ය. දූෂන චෝදනා සම්බන්ධයෙන් කවිධ පරීක්ෂනවලට ලක්ව සිටීමේ හේතුව මත රූපවාහිනී කැමරා ඉදිරියේ පෙනී නොසිටීමට වෙර දරමින් සිටි ඩිලේ දැන් එම කැමරා ඉදිරියේ පෙනී සිටිමින් ප්‍රකාශ කලේ ''මේ දැන් ෆ්ලොරිඩාහි අනාරක්ෂිත ඇමරිකානු පුරවැසියෙකුට එරෙහිව මිනීමැරුමක් සිදුකෙරෙමින් තිබෙන'' බවයි.

පුවත්පත්වලට කාන්දු වීමට ඉඩ හැර ඇති අත්සනක් නොමැති එක් පිටුවක සටහනක් තුලින් රිපබ්ලිකන් පක්ෂ නායකත්වයෙහි නරුමත්වය ඉස්මතු කෙරේ. ''සංවාදයේ මාතෘකා'' යනුවෙන් හඳුන්වා ඇති එය රිපබ්ලිකානු සෙනෙට් සභිකයන් අතර බෙදා හැර ඇත. ''මෙය වැදගත් සදාචාරාත්මක ප්‍රශ්නයක් වන අතර එය සෙනෙට් සභාව තුල විවාදයට භාජන වීමේ දී ජීවත්වීමේ අයිතිය වෙනුවෙන් පෙනී සිටින්නන් උද්යෝගයට පත් කරනු ඇත.'' එම සටහනේ සඳහන් කෙරින. ලබන වසරේ දී යලි තේරී පත් වීමට ඉදිරිපත්ව සිටින ෆ්ලොරිඩාහි ඩිමොක්‍රටික් සෙනෙට් සභික බිල් නෙල්සන්ට බැට දීමට මෙයින් ලැබෙන අවස්ථාව ගැන ද එය සඳහන් කරයි. ''මෙය බලගතු දේශපාලන ප්‍රශ්නයකි. මන්ද යත්, මේ සම්බන්ධයෙන් සම-අනුග්‍රහයෙකුවීමට ෆ්ලොරිඩාහි සෙනෙට් සභික නෙල්සන් දැනට මත් ප්‍රතික්ෂේප කර ඇති අතර මෙය ඩිමොක්‍රටිකයන් ට බරපතල ප්‍රශ්නයකැ''යි සටහනින් කියැවිනි.

ෂියාවෝ සිද්ධියෙහි ඉතා වැදගත් අංගයක් වනුයේ නියෝජිත මන්ත්‍රී මන්ඩලයෙහි හා සෙනෙට් සභාවෙහි සෑම ඩිමොක්‍රටිකයෙකුම වාගේ ක්‍රිස්තියානි දක්ෂිනාංශය සමග පුලුල් පරිමාන සහයෝගිතාවකින් කටයුතු කිරීම ය. ගබ්සාවන්හි විරුද්ධවාදියෙකු වන සෙනෙට්සභා සුලුතරයෙහි නායක හැරී රිඩ්, ෂියාවෝ නඩුවට අනුව විශේෂ නීති සම්පාදනය කිරීමේ සැලැස්ම සමග ඉක්මනින් ම එකට පෙලගැසුනු අතර එම නීතිය සම්මත කරවා ගැනීමට විරුද්ධ වීමෙන් හා අවහිර කිරීමෙන් වැලකී සිටීම සඳහා සාමාජිකයන් 42දෙනෙකුගෙන් යුත් මුලු ඩිමොක්‍රටික් කන්ඩායම ම හසුරුවා ගැනීමට කටයුතු කලේ ය.

ඊලඟ දිනයෙහි පැවැත්වීමට නියමිත ඡන්ද විමසීමට මග පාදා ගැනීම සඳහා සෙනසුරාදා පැවති සෙනෙට් සැසියට සහභාගි වූයේ රිපබ්ලිකානුවන් දෙදෙනෙකු හා එක් ඩිමොක්‍රටිකයෙකු පමනි. ප්‍රමුඛ ලිබරල්වාදියෙකු වන ඉයෝවා ප්‍රාන්තයෙහි සෙනෙට් සභික ටොම් හාර්කින්, නීති කෙටුම්පත සම්මත කරවා ගැනීම පහසු කර ගැනීම සඳහා කටයුතු කලේ ය. සෙනෙට් සභාව ඉරිදා දිනයේ දී නීත කෙටුම්පත ඒකමතිකව අනුමත කලේ එය සම්මත කිරීමෙහි ලා සෑම ඩිමොක්‍රටික් සෙනෙට් සභිකයෙකු වෙත ම වගකීම පවරමින් ය.

අසාමාන්‍ය සැසි වාරයක් හිමිදිරියේ පැවැත්වීමට බලකරමින් බොහෝ ඩිමොක්‍රටික් මන්ත්‍රීන් නීතිය සම්මත කිරීමට පුද්ගලිකව විරුද්ධත්වය පල කල ද මන්ත්‍රී කන්ඩායමේ නායකත්වය නිහඬව ම ඊට අනුමැතිය පල කලහ.

වෛද්‍ය නිගමන මත කටයුතු කිරීමේ සිය බිරිඳගේ කැමැත්ත ක්‍රියාත්මක කිරීමේ අයිතිය මයිකල් ෂියාවෝට අහිමි කරන විශේෂ නීතියක් කෙටුම්පත් කිරීම හෙලා දුටු ෂියාවෝගේ නීතිඥ ජෝර්ජ් ෆෙලෝස් යථාර්ථවත් ප්‍රකාශයකට මෙය තුඩු දුන් අතර සිතාසි නිකුත් කිරීමේ ආරම්භක උත්සාහය ''මැරකමක් ලෙස ඔහු කියා සිටියේ ය.'' එය ද්වේශ සහගත ය, එය කම්පාවට පත් කරන සුලු හා පිලිකුල් සහගත ය. සියලු ඇමරිකානුවන් මෙය අනතුරු ඇඟවීමක් ලෙස ගත යුතු ය යි මම සිතමි.'' ෆෙලෝස් කියා සිටියේ ඩිමොක්‍රටිකයන් වසයෙන් ''ඔවුන් ටෙරී ෂියාවෝ වෙනුවෙන් නැඟී නො සිටින්නේ නම් ඔවුන් සුදුසු වන්නේ සුලුතරයේ පක්ෂයක් වීමට ය. සිය පවුලේ කටයුතුවලට දේශපාලන කව පොලඹවන ලද ආන්ඩුවේ ඇඟිලිගැසීම රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක දී මයිකල් ෂියාවෝ හෙලා දුටුවේ ය. ''ටෙරීට අවශ්‍යවුනේ මෙය යි. මෙය ඇගේ කැමැත්ත ය'' යි සිකුරාදා සීඑන්එන් නාලිකාවෙන් ඔහු කියා සිටියේ ය. ආන්ඩුව ''මගේ පුද්ගලික ජීවිතය මුලුමනින් ම පාගා දමී ය'' ඔහු කීය. ''තමන් කිසිවක් නොදන්නා දෙයක් හරි මැදට කොන්ග්‍රසය''කඩාවැදී ඇත. මෙය කනගාටු දායක ය. ඔවුන්ට මේ දේ මට කල හැකි වී නම් මෙරටෙහි සෑම කෙනෙකුටම එය කල හැකි වේ.''

මේ අනතුරු ඇඟවීම හොඳින් සිත්හි රඳවා ගත යුතු ය. සිය මූලධර්මවාදී ආගමික දෘෂ්ටීන් සමග එකඟ නොවන බහුතරයක් ඇමරිකානුවන් මත එය බලෙන් පැටවීම උත්සුක වන දක්ෂිනාංශික උන්මත්තකයන්ගේ ආඥාදායකත්වයක් කරා එක්සත් ජනපදය කොතෙක් දුර ගමන් කර ඇත්දැයි ෂියාවෝ සිද්ධිය පෙන්නුම් කරයි.

ටෙරී ෂියාවෝ ජීවත්වන ෆ්ලොරිඩා ප්‍රාන්තයෙහි පයිනිලාස් පාක් හි ගිලන්නිවස ඉදිරිපිට දර්ශනය පිලිබඳ පුවත්පත් වාර්තා ''ටෙරී බේරා ගැනීමේ'' ව්‍යාපාරය වටා එක්රැස් වූවන්ගේ උමතු ස්වභාවය පෙන්නුම් කරයි. සාපේක්ෂව අතලොස්සක් වූ පැමින සිටි පෙලපාලිකරුවන්ගෙන් වැඩි දෙනා අති දක්ෂිනාංශික විරෝධතා රැල්ලේ නිත්‍ය ක්‍රියාකාරීන් ය. එක් විස්තරයකට අනුව ඉන් බොහෝ දෙනකු පසුගිය වසරේ දී දූවැන්ත දස පනත සිහිවටනය ඉවත් කිරීමට විරෝධය පානු වස් ඇලබාමාහි ශ්‍රේෂ්ඨාධිකරනය ඉදිරිපිට පෙනී සිටියවුන් හා ගබ්සා සායනවලට අවහිර කිරීම සඳහා ඒකරාශී වූවන් ය.

එහි පැමින සිටියවුන් අතර ක්‍රිස්තියානි ආරක්ෂක ලීගයේ පැට්‍රික් මැහෝනි හා බේරාගැනීමේ මෙහෙයුම් රැන්ඩෝල් ටෙරී ද වූ අතර ඔවුන් දෙදනාම ගබ්සා සායනවලට එරෙහි ප්‍රචන්ඩ ප්‍රහාරවලට සම්බන්ධ වූවන් ය. ඇතැම් විරෝධතාකරුවන්, විවෘතවම ප්‍රචන්ඩත්වය අවුලුවන සංඥා පුවරු ගෙන ගිය අතර විනිසුරු ග්‍රියර් ''අධිකරන මිනීමැරුමට'' සම්බන්ධ බවට කෙරෙන දෝෂාරෝපන හෝ ජීවිතාධාරක කපා හැරිය යුත්තේ ටෙරීගේ නොව මයිකල් ෂියාවෝ බව ඒවායේ සඳහන් විය.

සෙනසුරාදා උදෑසන, ගිලන් නිවසට ඇතුලු වීමට තැත් කල තිදෙනෙකු අනවසරයෙන් ඇතුලු වීමේ චෝදනා මත අත් අඩංගුවට ගන්නා ලදී. ඉන් එක් අයෙකු වූයේ වියට්නාම් යුද්ධයේ ග්‍රීන් බෙරේ හමුදා කන්ඩායමේ අනදෙන නිලධාරි ජේම්ස් ''බෝ'' ග්‍රිට්ස් ය. කලක සිට ෆැසිස්ට්වාදී හමුදා මිලීෂියාවන් තුල කැපීපෙනුනු පුද්ගලයෙක් වූ ඔහු අන්ත දක්ෂිනාංශික කන්ඩායමක ජනාධිපති අපේක්ෂකයා ලෙස ද තරග කලේ ය.

එවැනි කොටස් හා කොන්ග්‍රසයෙහි රිපබ්ලිකන් නායකත්වය අතර අනේකවිධ සබඳකම් පවතියි. විශේෂයෙන් ම, ඩිලේ, විනිසුරු ග්‍රියර්ට මයිකල් ෂියාවෝට හා ෂියාවෝගේ නීතිඥ, ජෝර්ජ් ෆෙලොස්ට එරෙහිව ප්‍රචන්ඩත්වය වෙනුවෙන් සෘජුවම ඉල්ලීම් කරන බවක් පෙනී යයි. ග්‍රියර්ගේ නියෝගය ''ම්ලේච්ඡ'' එකක් සේ හඳුන්වමින් ඔහු එයට පහර දුන් අතර ෆෙලෝස්, ''දුෂ්ටත්වයේ පුද්ගලාරෝපනය'' ලෙස හැඳින්වී ය. ෂියාවෝට පෞද්ගලිකව පහර එල්ල කලේ ය. ''මෙම කාන්තාවට මෙයාකාරයෙන් සැලකූ ඔහුට මා තුල නම් වැඩි ගෞරවයක් නැහැ''යි ද ''ඔහු මොන ජාතියේ මිනිසෙක්ද යි'' ද ඔහු ප්‍රකාශ කලේ ය.

ෂියාවෝ නඩුවෙහි නෛතික හා ව්‍යවස්ථාමය ගම්‍යයන් අතිශයින්ම ප්‍රතිගාමී වේ. නියෝජිත මන්ත්‍රී මන්ඩලය හා සෙනෙට් සභාව හරහා මහත් කලබලයකින් සම්මත කරගන්නා ලද මේ නීති කෙටුම්පතෙහි පූර්වාදර්ශයන් නො වන බවත් එය අදාල වන්නේ ටෙරී ෂියාවෝ හා ඇගේ දෙමාපියන්ට පමනක් බවත් සඳහන් කිරීම සැලකිල්ලට ගත යුතු කරුනකි. 2000 වර්ෂයෙහි පැවති ජනාධිපති මැතිවරනයෙහි ප්‍රතිඵලය තීරනය කරමින් ධවල මන්දිරය බුෂ්ට ප්‍රධානය කල එක්සත් ජනපද ශ්‍රේෂ්ඨාධිකරනය බුෂ්ට එරෙහිව ගෝර් ප්‍රශ්නය සම්බන්ධයෙන් දෙන ලද අපකීර්තිමත් තීන්දුවෙහි දී උපයෝගී කරගන්නා ලද තර්කනය ද මෙය ම වේ.

පෞද්ගලික නඩුවක දී ප්‍රාන්ත උසාවියක නිශ්චිත තීන්දුවක් කනපිට හැරවීම එකම අරමුන ඇතිව නීතියක් පැනවීම තුලින් කොන්ග්‍රසය අත්තනෝමතික ආකාරයේ බලතල ආරූඪ කර ගන්නා අතර පිරික්සුම් හා සංතුලයන් සහිත මුලු එක්සත් ජනපද ව්‍යවස්ථා පද්ධතියම සැලසුම් කරන ලද්දේ එවැන්නක් වැලැක්වීම සඳහා ය.

එය නීතියේ ආධිපත්‍යය මත නොව, ධවල මන්දිරය අරක්ගෙන සිටිනා හා කොන්ග්‍රසයෙහි පටු බහුතරයෙන් පවා පාලනය කරන පක්ෂය විසින් නිරපේක්ෂ බලය පාවිච්චි කිරීම මත පදනම් වන පද්ධතියක් කරා ගන්නා යෝධ පියවරකි.